# උළුහාල් වගා කිරීම

පී. දයානන්ද - කෘෂිකර්ම උපදේශක

උළුහාල් රනිල කුලයට අයත්ය. සිහින් රවුම් කඳක් ඇති, වැඩියෙන් අතු බෙදෙන වාර්ෂික පැළෑටියක්. තටුවක කොළ 03 කි. පත්‍ර නාරටි ලා කොළ පාටය. මල් සුදු හෝ ලා කහ පාටය. කරල් 3'' - 4'' දිගය. කරලක ඇට 10 ත් 20 ත් පමණ ඇත. ඉහල ඌවේ පහත් බිම්වල උළුහාල් වගා කල හැකි බව රහන්ගල පැවැත්වූ පරීයෙෂණ වලින් ගෙලි වී ඇත. යල කන්නයේ පලමුවෙන්ම ඇදහැලෙන වර්ෂාවත් සමඟම බීජ වැපිරීම කල යුතුයි. බීජ වැපිරීම සඳහා සියුම්ව පස සකස් කරන්න. ජලසම්පාදනය කිරීමට බලාපොරොත්තු වන විට, සුදුසු ප්‍රමාණයේ පාත්ති සාදා ගන්න.

## වගා කිරීම

පේලි අතර පරතරය 9'' විය යුතුයි. අක්කරයකට බීජ ප්‍රමාණය රා: 15 - 20 දක්වාය. බීජවල අක්‍රිය කාලය සති 2 - 3 දක්වාය. බීජ වපුරා දින 4 - 6 දී පැලවීම සිදුවේ. පැලවී දෙවන සතියේදී පැල මුලට පස් එකතු කල යුතුය. අත්මුල්ලුවක් මගින් නැවත වරක් පේලි දෙකක් අතර පැල වැඩීමට පෙර, පස් බුරුල් කල යුතුය. බීජ පැල වී සති 6 - 7 පසු මල් පිපේ. ඊට සති 7 - 8 කට පසුව කරල් මේරූ විට අස්වනු ලැබිය හැකි අවස්ථාව එළඹේ. දිලීර රෝග වැලදුනහොත් දිලීර නාශකයන් යෙදීමෙන් දිලීර සහ පුස් රෝග මර්දනය කරන්න. මේ සඳහා ගෙන්දගම් හෝ බෝඩෝ මිශ්‍රණය යෙදීම යහපත් ප්‍රථිඵල ගෙන දේ.

## අස්වැන්න නෙලීම

වගාකර මාස 3 - 3 1/2 කදී අස්වනු නෙලාගත හැක. වියලි බීජ සහිත පැල ගලවා වේලෙන්නට තබා ලීයකින් තලන්න. බීජ පොලා වියලා ගැනීමෙන් පසු ගබඩා කල හැක. අක්කරයකින් බීජ රා: 400 සිට 1000 දක්වා අස්වැන්නක් ලැබිය හැක.

# FENUGREEK

Fenugreek can be grown successfully in Upper Uva area. Seed should be planted in rows 9" apart in well prepared soil. Seed rate per acre is 15 - 20 lbs. The plants flower in 6-7 weeks after germination. Harvesting is done 7-8 weeks after flowering. If fungal diseases occur spray Sulphur or Bordeaux misture. Fenugreek is a 3-3½ month crop. When the crop is mature up-root plants and stack for about 2 days. Seed can be separated by beating with a stick. Yield is about 400-1000 lbs. of seed per acre.

## வெந்தயம்.

வெந்தயம் மேல் ஊவா மாகாணத்தில் திருப்திகரமாய் விளைவிக்கலாம். 3-3½ மாத வயதுடைய இதை நன்கு பண்படுத்தப்பட்ட தரையில் வரிசையில் 9" இடைவெளி இருக்கக்கூடியதாய் நடலாம். முளைத்து 6-7 கிழமையில் பூக்கும். பூத்து 6-8 கிழமைகளில் பயிர் முதிர்ச்சியடையும்போது பயிரைப் பிடுங்கி 2 நாளைக்கு வெயிலில் குவித்து வைத்து பின் தடியால் அடித்து விதையைப் பிரிக்கலாம்.

ஒரு ஏக்கருக்கு 15-20 இரு.விதை தேவை. ஒரு ஏக்கரில் விளைவு 400-1000 இருத்தலாகும்.

කෘෂි සඟරාවට ලැබෙන ලිපි, ලිපිය ලැබුනු භාෂාවෙන්ම පල කරනු ලැබේ. එම ලිපියේ සාරාංශ අනෙක් භාෂා දෙකෙන් පල කරන්නෙමු. සාරාංශ වශයෙන් එලවන ලිපිවල පූර්ණ සිංහල අනුවාදයක් අවශ්‍ය අයෙකුට ලිඛිතව ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැක. එවැනි ඉල්ලීම් හෝ සඟරාවේ පල කිරීම සඳහා එවන ලිපි පහතින් දැක්වෙන ලිපිනයට එවන්න.

සංස්කාරක - කෘෂි
ලේඛණ විභාජන මධ්‍යස්ථානය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය